# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1985 අංක 30 දරන
# විශ්‍රාම වැටුප් (විශේෂ විධිවිධාන)
# පනත

---

[සහතිකය සටහන් කළේ 1985 අගෝස්තු මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

**1985 අගෝස්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

**මිළ : ශත 30 යි** — **තැපැල් ගාස්තුව : ශත 60 යි**

# 1985 අංක 30 දරන විශ්‍රාම වැටුප් (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1985 අගෝස්තු මස 06 වන දින]

එල්. ඩී.—ඕ. 28/84

**විශ්‍රාම වැටුප් ගෙවීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ හෝ බ්‍රිතාන්‍ය කඳවුරුවල හෝ සිවිල් සේවා නියුක්තයන්ගේ සහ සේවා මුක්ත භටයන්ගේ සේවාවන් ගණන් ගැනීම සඳහා ද ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1985 අංක 30 දරන විශ්‍රාම වැටුප් (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (357 වන අධිකාරය වූ) යුද්ධ හමුදා පනතේ, (358 වන අධිකාරය වූ) නාවුක හමුදා පනතේ, (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ, ඒවා යටතේ සාදන ලද නියෝගවල හෝ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ හෝ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද— — විශ්‍රාම වැටුප් සඳහා පූර්ව සේවාව ගණන් ගනු ලබන බව.

(අ) බ්‍රිතාන්‍ය ආණ්ඩුව යටතේ ශ්‍රී ලංකාව තුළ කලින් පිහිටුවා තිබුණු බ්‍රිතාන්‍ය සේවා ආයතන වල සිවිල් සේවා නියුක්තයකු වශයෙන් සේවාව ; හෝ

(ආ) ශ්‍රී ලංකාව තුළ බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ හෝ ඔවුන්ගේ කඳවුරුවල හෝ සන්නද්ධ බලකායවල සේවාව

ඒ නියෝග හෝ ව්‍යවස්ථා සංග්‍රහය හෝ යටතේ විශ්‍රාම වැටුප් ගෙවනු ලැබිය යුතු සේවය ද සමග ඔවුන් සේවයේ නියුක්ත කර ගනු ලැබූ දිනය හෝ 1939 සැප්තැම්බර් මස 3 වන දිනය හෝ යන දින දෙකින් පසුව යෙදෙන දිනයෙහි සිට, විශ්‍රාම වැටුප් කාර්යය සඳහා ගණන් ගනු ලැබිය යුතු ය.

3. ශ්‍රී ලංකාව තුළ බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ හෝ ඔවුන්ගේ කඳවුරුවල සිවිල් සේවා නියුක්තිය හෝ සන්නද්ධ බලකායවල සේවාව ඇති යම් තැනැත්තකු විශ්‍රාම ගොස්, විශ්‍රාම වැටුප් කාර්යය සඳහා ඒ සේවාව ගණන් නොගෙන ඔහුගේ විශ්‍රාම වැටුප් ආගණනය කරනු ලැබ ඇති අවස්ථාවක, මේ පනතේ 2 වන වගන්තිය ප්‍රකාර ප්‍රතිලාභ ඔහුට ලබාදිය හැකි වන පරිදි, ඒ තැනැත්තාගේ විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු ය. — විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීම.

4. ශ්‍රී ලංකාව තුළ බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ හෝ ඔවුන්ගේ කඳවුරුවල සිවිල් සේවා නියුක්තිය හෝ සන්නද්ධ බලකායවල සේවාව හෝ ඇති යම් තැනැත්තකු වෙනුවෙන් කිසියම් නියෝගයක් යටතේ යම් පාරිතෝෂිකයක් ගෙවනු ලැබ ඇති අවස්ථාවක, ඒ පාරිතෝෂිකය ඔහුගේ විශ්‍රාම වැටුප එසේ ප්‍රතිශෝධනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පරිවර්තිත පාරිතෝෂිකය හෝ විශ්‍රාම වැටුප ලෙස ඒ තැනැත්තාට ගෙවනු ලැබිය යුතු යම් ගෙවීමකින් අඩු කර ගනු ලැබිය යුතු අතර එය ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය. — ගෙවන ලද පාරිතෝෂිකය අඩුකර ගැනීම.

2—ඒ 084073-7,725 (85/06)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.